සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

7 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය | කාලය පැය 02 යි

නම/ විභාග අංකය:

# I - කොටස

සැලකිය යුතුයි

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. සිදත් සඟරා හෝඩියේ ඇති අක්ෂර ගණන,

(i) 57 කි. (ii) 30 කි. (iii) 35 කි. (iv) 60 කි.

02. සඤ්ඤක අක්ෂරයක් සහිත වචනයක් නොවන්නේ,

(i) දඟරය (ii) දඬුවම (iii) ළදරුවා (iv) පඳුර

- **ඉරි ඇඳි පදයට වඩාත් ගැළපෙන පිළිතුරු තෝරන්න.**

03. මාමා අද <u>කුකුළත් අතින් අරගෙන</u> ම ආවා යැයි මල්ලී කිව්වේ ය.

(i) උදේ පාන්දර ම (ii) කුකුළෙක් අරගෙන

(iii) වේලාසනින් (iv) සන්ධ්‍යා කාලයේ

04. විභාගයේ ප්‍රතිඵල ලැබෙන තුරු මම <u>ඇඟිලි ගනිමින් සිටියෙමි</u>.

(i) ඇඟිලි ගණන් කිරීම. (ii) ඉවසීමෙන් යුතුව බලා සිටීම.

(iii) නොඉවසිල්ලෙන් බලා සිටීම. (iv) කලබලයෙන් බලා සිටීම.

05. පහත වාක්‍යයෙහි ඇති මහාප්‍රාණ අක්ෂර සහිත වචන 02 ක් ලියන්න.

හමුදා නිලධාරීහු අභිමානයෙන් යුතුව ජාතික උත්සවයට සහභාගී වූහ.

(i) ........................................................ (ii) ..................................................................

06. උපසර්ගයක් සහිත වචනය යටින් ඉරක් අඳින්න.

(i) සුන්දර (ii) ඉතිහාසය (iii) සුවිශේෂ (iv) ඉසුරුමත්

07. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය යටින් ඉරක් අඳින්න.

(1) (i) වීරෝදාර (ii) මර්ධනය (iii) වර්ධනය (iv) කණිෂ්ඨ

(2) (i) කණ්නාඩි (ii) ලේඛණය (iii) ශ්‍රේෂ්ඨ (iv) ප්‍රනාමය

08. ප්‍රථම පුරුෂ අතීතකාල බහු වචන ක්‍රියා පදයක් වන්නේ,

(i) ගියහ. (ii) යති. (iii) යන්නෝ ය. (iv) යන්නෙහු.

09. දී ඇති පදයට සමානාර්ථයක් නොවන පදයක් තෝරා යටින් ඉරක් අඳින්න.

(i) ප්‍රවීණ - දක්ෂ / නිපුණ / ආධුනික

(ii) සූර්යයා - දිනකර / තරිඳු /දිනිඳු

10. දී ඇති පදවලට විරුද්ධාර්ථ පදය ලියන්න.

(i) බාහිර - ............................................ (ii) කීර්තිය - ........................................................

11. පහත දක්වා ඇති පදවල අනුක්ත පද ලියන්න.

(i) මිනිස්සු - ........................................... (ii) බැමිණියක් - .....................................................

12. ඉරි ඇඳි පදය අයත් ක්‍රියාපද වර්ගය තෝරන්න.

(i) නංගී <u>අඬමින්</u> මව සෙව්වා ය.

(අවසාන ක්‍රියා / මිශ්‍ර කියා / පූර්ව ක්‍රියා / ආශිර්වාද ක්‍රියා)

(ii) ඈ පාන්දරින් <u>අවදි වී</u> චාරිකාව යාමට සූදානම් වූවා ය.

(මිශ්‍ර ක්‍රියා / පූර්ව ක්‍රියා / ආශිර්වාද ක්‍රියා / අවසාන ක්‍රියා)

13. පහත සඳහන් කමත් භාෂාවේ යොදා ඇති වචන සඳහා අදාළ වචන ලියන්න.

(i) සේදැරි කරනවා - ...........................................................................

(ii) රතු ගගුල - ....................................................................................

14. පහත වචන සඳහා ගැළපෙන පුරුෂ ලිංග පද ලියන්න.

(i) සෙබඩ - ........................................... (ii) වැලහින්න - .................................................

15. පහත වචන සඳහා බහු වචන පද ලියන්න.

(i) මිනිසා - ................................................ (ii) තරුණිය - ......................................................

16. පහත වාක්‍යයෙහි ඇති නාම විශේෂණ පදයක් හා ක්‍රියා විශේෂණ පදයක් ලියන්න.

අපි සියල්ලෝ ම සුන්දර වෙල්යාය මැදින් ඉමිහිරි අඹ රස විඳමින් සතුටින් ගමන් කළෙමු.

(i) නාම විශේෂණ - .......................................... (ii) ක්‍රියා විශේෂණ - .................................................

17. පහත වාක්‍යයේ උපමාව උපුටා දක්වන්න.

සමන් පිච්ච මල් ඉහිරුණු - නිල් තණකොළ පිට්ටනියක්

වගෙයි අහස අන්න බලනු - කොච්චර ලස්සන ද රෑට

..............................................................................................................

18. දී ඇති වාක්‍යයංශයට ගැළපෙන තනි පදය ලියන්න.

(i) දෙවියන්ට ආවතේව කරන ස්ත්‍රිය - ..........................................................................

(ii) කිසිවකුට බැඳීමක් නොමැති - ................................................................................

19. පහත ප්‍රස්තාව පිරුළු දෙක සම්පූර්ණ කරන්න.

(i) ඇටි කෙහෙල් කාපු ..................................................................................

(ii) වඳින්න ගිය දේවාලේ ............................................................................

20. පහත වාක්‍යවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

වෙළෙන්දා වළං ................................................ (කද / කඳ) රැගෙන හඬ නගමින් ගම පුරා ඇවිද වෙහෙස නිවාගැනීමට පාර අසළ තිබූ විශාල කොහොඹ ගසේ .............................................. (කද / කඳ)මත වාඩි වූයේ ය.

(ලකුණු 2 × 20 = 40)

## II - කොටස

**සැලකිය යුතුයි.**

- **පළමු, දෙවන, තෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

01. කෙටි පිළිතුරු සපයන්න.

(1) වර්තමාන සිංහල අක්ෂර මාලාවේ,

(i) ස්වර අක්‍ෂර ගණන කිය ද?

(ii) ව්‍යඤ්ජන අක්ෂර ගණන කීය ද?

(2) පහත වචන දෙකෙහි ස්වර ව්‍යඤ්ජන වෙන්කර ලියන්න.

උදා - සුපිපි ස් + උ / ප් + ඉ / ප් + ඉ

(i) අනුලෝම (ii) පිළිතුරු

(3) පහත අක්ෂර යෙදෙන වචනය බැගින් ලියන්න.

(i) ඨ - ...................................... (ii) ඪ - .........................................

(4) පහත වචන දෙකෙහි අර්ථ ලියන්න.

(i) වහන් සඟළක් - (ii) බැණ නොනැඟි -

(5) පහත කෘතිවල රචකයන් නම් කරන්න.

(i) මග දිගට ජන කතා - .........................................................

(ii) කියවන නුවණ- ................................................................. (ලකුණු 10)

02. පහත මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 150 ක පමණ රචනයක් ලියන්න.

(1) අසිරිමත් සමනළ අඩවිය. (2) සුන්දර දේශයක් ගොඩනගමු.

(3) සෞඛ්‍යවත් ආහාර රටාවකට හුරුවෙමු. (4) ජල සම්පත සුරකිමු.

(5) මම ගංවතුරකට හසුවීමි. (ලකුණු 20)

03. පහත (අ) සහ (ආ) යන කොටස් දෙකෙන් එකකට පිළිතුරු සපයන්න.

(අ) ඔබේ පාසලේ පැවැත්වීමට නියමිත ශිෂ්‍ය නායක නිල ලාංඡන පැලඳවීමේ උත්සවය සඳහා වයඹ පළාත් නියෝජ්‍ය පොලිස්පතිතුමාට ආරාධනා කරමින් ආරාධනා පත්‍රය සකස් කරන්න.

ස්ථානය - වයඹ පළාත් සභා ශ්‍රවණාගාරය

දිනය - 2025. 05. 21

වේලාව - පෙ. ව. 9. 00

ශිෂ්‍ය නායක මණ්ඩලය භාර ගුරුමණ්ඩලය සංවිධානය කරනු ලබයි.

(ආ) කොරෝනා රෝගය යළි හිස ඔසවමින් පවතියි. ඒ නිසා ම පාසල් සෞඛ්‍යදාන සංගමය මඟින් සිසු සිසුවියන් දැනුවත් කිරීම සුදුසු යැයි තීරණය කර ඇත. ඒ සඳහා 2025 මැයි 27 දින පෙ. ව. 10. 00 ට පාසල් ශ්‍රවණාගාරයේ දී සියලු සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමට තීරණය කර ඇත. ඔබ සෞඛ්‍යදාන සංගමයේ ලේකම් සඳලි වික්‍රමසිංහ යැයි සිතා මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාට ඒ සඳහා සහභාගීවන ලෙස දන්වමින් රාජකාරී ලිපිය ලියන්න. (ලකුණු 10)

04. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ශ්‍රී ලංකාවේ නූතන පුරාවිද්‍යාත්මක කටයුතු ආරම්භ කළේ මීට අවුරුදු 150කට පමණ පෙර ය. ඒ කාර්යයෙහි නියුක්ත වූ බ්‍රිතාන්‍ය පුරාවිද්‍යාඥ එච්. සී. පී. බෙල් මහතා වසර ගණනාවක් තිස්සේ එහි වැඩ කළේ පස්වන සියවසේ සීගිරිය නිර්මාණය කළ මහා නිර්මාපකයන් හා පෙදරේරුවරුන් මුහුණ දුන් පරිසරයට සමාන පරිසරයක් තුළ විය හැකි ය. ඈත අතීතයේ මෙන් ම මෙවරත් සීගිරිය ගොඩ නැඟීමේ මහා කර්තව්‍යයේ වැඩි බර කොටස උසුලන ලද්දේ සීගිරිය අවට ගම්වලින් පැමිණි ගොවීන් හා කම්කරුවන් විසිනි.

(1) ශ්‍රී ලංකාවේ නූතන පුරාවිද්‍යා කටයුතු ආරම්භ කළ පුරාවිද්‍යාඥයා කවු ද?

(2) නූතන පුරාවිද්‍යා කටයුතු ආරම්භ කළේ කුමන කාලයේ ද?

(3) සීගිරිය නිර්මාණය කළ සියවස කුමක් ද?

(4) සීගිරිය ගොඩනැඟීමේ කර්තව්‍යයේ මෙවර වැඩි බර කොටසක් උසුලන ලද්දේ කවුරුන් ද?

(5) මෙම ඡේදයේ සඳහන් ප්‍රථම පුරුෂ බහු වචන අනුක්ත පද 02 ක් ලියන්න. (ලකුණු 10)

05. (i) පහත වාක්‍ය නිවැරදි කර ලියන්න.

(1) මම තුඹසේ සිටි නයෙක් දැක බියවීමි.

(2) කුරුල්ලන් කැදලි කරා පියැඹූහ.

(3) තාරකා රෑ අහසේ බබළති.

(4) දෙමව්පියන් තම දරුවන් මැනවින් සුරකිති.

(5) තොපි ඊයේ පුස්තකාලයට ගියෙහි.

(ii) පහත වාක්‍ය බහු වචනයට හරවා ලියන්න.

(1) නුඹ මිහිරි ගීතයක් ගැයුවෙහි. (2) ඈ රැස්වීමට සහභාගි වූවා ය.

(3) මම රෝගී වූ අයෙකුට පිහිට වීමි. (4) වැද්දා මුවෙකු පසුපස හඹා ගියේ ය.

(5) ලේඛකයා නවකතාවක් ලිවීම අරඹයි. (ලකුණු 10)

06. පහත පද්‍ය පාඨවල ඉතිරි පද සම්පූර්ණ කරන්න.

(1) මේ කාගේ මේ කමතා
ඉරු දෙවියන්ගේ කමතා
..........................................................................
..........................................................................

(2) සුර රද සමන් සමඟින් සුරඟන එවර
පැහැනද මදාරා පරසතු මල් පතර
..........................................................................
..........................................................................

(3) මහනෙල් සුවඳමය
කුඩ මසු පිළී ගඳමය
..........................................................................
..........................................................................

(4) මගෙ තුන් මැසි දියණිගේ
රසවත් සිහිනය දිගේ
..........................................................................
..........................................................................

(5) මා වැනි බිලින්දා
වර වර ළඟට කැන්දා
..........................................................................
.......................................................................... (ලකුණු 10)

07. පහත ප්‍රකාශ කා විසින් කා හට පවසන ලද ද දක්වා පාඩමේ නම ලියන්න.

| පාඩමේ නම | කා විසින් ද? | කා හට ද? |
|---|---|---|
| | | |

(1) ''කවු ද ඈට බය ? ගැහැනියකට බයේ කෑම නොකා පළා යනවායැ.....''

(2) ''ඕක තමයි මම ඊයේ රෑත් කිව්වේ. ගෙන යන ඒවා හොඳ සිහියෙන් දා ගන්න කියලා''

(3) ''මුලින් ම කහවතුර ඉහලා හඳුන් කිරිපැණි ඉහලා තමයි නිදන් වස්තු තියන්නේ''

(4) ''යතුර වී බිස්ස ළඟ එල්ලලා ඇති.....''

(5) ''කුඩා කොල්ලා හෙයින් බඩ සයින් කාපුව මැනව....'' (ලකුණු 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) ii (02) iii (03) i (04) iii (05) නිලධාරීහු / අභිමානයෙන් / සහභාගි (06) iii

(07) i. වීරෝදාර ii. ශ්‍රේෂ්ඨ (08) i (09) i. ආධුනික ii. තරිඳු

(10) i. අභ්‍යන්තර ii. අපකීර්තිය (11) i. මිනිසුන් ii. බැමිණියක

(12) i. මිශ්‍ර ක්‍රියා ii. පූර්ව ක්‍රියා (13) i. ඉක්මන් කරනවා ii. තේ වතුර

(14) i. මොනරා ii. වලහා (15) i. මිනිස්සු ii. තරුණියෝ

(16) i. සුන්දර / ඉමිහිරි ii. සතුටින්

(17) සමන්පිච්ච මල් ඉහිරුණු නිල් තණකොළ පිට්ටනියක් වගෙයි (18) i. දේවදාසි ii. ස්වෛරී

(19) i. උගුඩුවා වගෙයි ii. ඉහේ කඩා වැටුණා වගෙයි (20) i. කද ii. කඳ

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

01. (1) (i) 18 (ii) 42
    (2) (i) අ / න් + උ / ල් + ඕ / ම් + අ (ii) ජ් + ඉ / ළ් + ඉ / ත් + උ / ර් + උ
    (3) ඨ- කනිෂ්ඨ, ශ්‍රේෂ්ඨ, කඨින ඪ- ආරූඪ, විරූඪ, ප්‍රෞඪ
    (4) (i) පාවහන් යුගලයක් (ii) කථා නොකර
    (5) (i) ඩී. පී. වික්‍රමසිංහ මහතා (ii) කුමාරතුංග මුනිදාස මහතා

02. රචනාවේ මාතෘකාවට අනුව ලකුණු විග්‍රහය.
    (1) සාරවත්භාවය මාතෘකාව ද ඇතුළු ව ලකුණු 07
    (2) සංවිධානය, නිර්මාණශිලීත්වය හා ස්වීයත්වය ලකුණු 10
    (3) ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා තිබීම. ලකුණු 03

03. (අ) ආරාධනා පත්‍රය
    (1) ආකෘතිය (ආරාධනා කරන්නා / දිනය / නිර්මාශීලී බව) = 03
    (2) අන්තර්ගතය (කාරණය / දිනය / වේලාව / ස්ථානය / ආරාධනාව) = 05
    (3) ශිල්පීය දක්ෂතා = 02
    මුළු ලකුණු = 10

    (ආ) රාජකාරී ලිපිය
    (1) ආකෘතිය (යවන්නාගේ ලිපිනය හා දිනය, ලබන්නාගේ තනතුර හා ලිපිනය, ආමන්ත්‍රණය, මාතෘකාව / අත්සන ) 03
    (2) අන්තර්ගතය = 05
    (3) ශිල්පීය දක්ෂතා = 02
    මුළු ලකුණු = 10

04. (1) බ්‍රිතාන්‍ය පුරාවිද්‍යාඥ එච්. සී. පී. බෙල් මහතා (2) මීට අවුරුදු 150 ක පෙරය.
    (3) පස්වන සියවස
    (4) සීගිරිය අවට ගම්වලින් පැමිණි ගොවින් හා කම්කරුවන් විසිනි.
    (5) (i) නිර්මාපකයන් (ii) පෙදරේරුවරුන් (iii) ගොවීන් (iv) කම්කරුවන්

05. (i) (1) මම තුඹසේ සිටි නයෙකු දැක බියවීමි.
    (2) කුරුල්ලෝ කැදලි කරා පියැඹූහ.
    (3) තාරකා රෑ අහසේ බබළයි. / තාරකාවෝ රෑ අහසේ බබළති.
    (4) දෙමව්පියෝ තම දරුවන් මැනවින් සුරකිති.
    (5) තෝ ඊයේ පුස්තකාලයට ගියෙහි. / තොපි ඊයේ පුස්තකාලයට ගියෙහු.

    (ii) (1) නුඹලා මිහිරි ගීත ගැයුවෙහු. (2) ඔවුහු රැස්වීමට සහභාගි වූහ.
    (3) අපි රෝගී වූ අයට පිහිට වීමු. (4) වැද්දෝ මුවන් පසුපස හඹා ගියහ. / ගියෝ ය.
    (5) ලේඛකයෝ නවකතා ලිවීම අරඹති.

06. (1) ඉරු දෙවියෝ බිම් බඳිතා
    බිම් බැඳි තැන කොළ බඳිතා
    (2) කැර පුද වඳින රැඳි මුනි සිරිපා තඹර
    සකි සඳ පෙනේ සමනොළ ගල නැගෙනහිර
    (3) දෙකට එක දියමය
    හොඳට නරකට දෙකට කටමය
    (4) සිනා කුමරි නටන කලාට
    දිටිමි සියලු රුව ඇගේ
    (5) දුක් සැප කුමක් දා
    අසන තිරිදෝ වෙන කොයින් දා

07.

| පාඩමේ නම් | කා විසින් ද? | කා හට ද? |
|---|---|---|
| ගොවි බිරිඳගේ නුවණ | නරියා | ව්‍යාඝ්‍රයාට |
| කථාබහට සංයමයක් | අක්කා | මල්ලීට |
| ඔයි රයිරේ ඔයිරාමා | දාවිත් රාලහාමි | අනුරාධ/ සිරිමල් දෙදෙනාට |
| ඔයි රයිරේ ඔයිරාමා | බංඩාර මැණිකේ (සිරිමල්ගේ මව) | සිරිමල්ට |
| තිලමුට්ටි ජාතකය | මහලු ස්ත්‍රිය | සිතුවිල්ලක් (තමාටම) |